<u>1938 කාන්තා උපකාරක දුරකථන සේවාවේ නව මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව</u>

ජාතික කාන්තා කමිටුවේ සභාපතිතුමියගේ පූර්ණ උපදේශකත්වය යටතේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් සකස් කරන ලද, 1938 කාන්තා උපකාරක දුරකථන සේවාවේ නව මෘදුකාංග පද්ධතිය ක්රියාත්මක කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව 2021/07/05 වන දින පෙ.ව 9.00 ට මුල් ළමාවිය සංවර්ධනය පිලිබඳ ජාතික ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.




මෙම පුහුණු වැඩසටහන සඳහා ජාතික කාන්තා කමිටුවේ විධායක අධ්‍යක්ෂ ඇතුළු 1938 කාන්තා උපකාරක දුරකථන සේවාවේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය, තොරතුරු තාක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ ඇතුළු එම අංශයේ නිලධාරීන් සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ කළමණාකරු (රාජ්‍ය අංශය) ඇතුළු නිලධාරින් සහභාගී විය.

මෙම පුහුණු වැඩසටහනේදී 1938 කාන්තා උපකාරක දුරකථන සේවාවේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය හට නව මෘදුකාංග පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ හා තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන් විසින් ලබා දෙන ලදී.


